Industry 2023

ජාතික කෙටි චිත්‍රපට තරගාවලිය

-------------------------

තේමාව - අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් වෙනුවෙන් රට තුළ කර්මාන්ත සංස්කෘතියක් ගොඩ නගමින් කර්මාන්ත ප්‍රබෝධයක් ඇති කළ හැකි ඕනෑම තේමා පරාසයක සිට නිර්මාණයන් ඉදිරිපත් කළ හැක.

මාධ්‍ය - ත්‍රෛභාෂාවන්ගෙන් ( සිංහල , දෙමළ , ඉංග්‍රීසි ) ඕනෑම භාෂා මාධ්‍යයක් භාවිතා කළ හැක.

තරග අංශයන් - ප්‍රධාන වශයෙන් පාසල් සහ විවෘත ලෙස දෙයාකාර වෙයි.

එම අංශ දෙක නැවත සිංහල මාධ්‍ය ,දෙමළ මාධ්‍ය , ඉංග්‍රීසි මාධ්‍ය ලෙස උප අංශ වලට වෙන් කෙරෙයි.

වයස් පරාසය - විවෘත අංශය - අවුරුදු 18 ට වැඩි පාසල් අංශය - අවුරුදු 17 ට අඩු

ත්‍යාග - තරග අංශ 3 සඳහා වෙන වෙනම මූල්‍යමය ත්‍යාග, කුසලාන හා සහතිකපත් පිරිනැමේ.

තරග කොන්දේසි

---------------

0. තරගකරුවන් එම තරග අංශවලට අදාළ වයස් කාණ්ඩයන් සපුරා තිබිය යුතුය

0. නිර්මාණයේ ධාවන කාලය අවම විනාඩි 3ත් , උපරිමය විනාඩි 10 ත් අතර විය යුතුය

0. ස්ව නිර්මාණයක් බවට තහවුරු කළ යුතුය

0. නිර්මාණයේ නිෂ්පාදන කාර්යන් සඳහා කර්මාන්ත අමාත්‍යංශය හෝ කාර්මික සංවර්ධන මණ්ඩලය කිසිදු වගකීමක් දරනු නොලැබේ

0. ජයග්‍රාහී නිර්මාණයන් අනෙකුත් භාෂා මාධ්‍යයන්ගෙන් හඬ කැවීමට හෝ උපසිරැසි යෙදීමට අවසර ලබාදිය යුතුය

0. ජයග්‍රාහී නිර්මාණයන් කර්මාන්ත අමාත්‍යංශයේ සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ජාතික ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතයට අවසර ලබාදිය යුතුය

0. සියළු නිර්මාණයන් video මාධ්‍යයේ තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය

0. නිර්මාණයන් තරගය සඳහා භාර දීමේදී DVD පිටපත් දෙකක් භාර දිය යුතුය

0. ජයග්‍රාහී නිර්මාණයන්හි පිටපත් ත්‍යාග ප්‍රදානයට ප්‍රථම IDB ඉල්ලා සිටින තාක්ෂණික ආකෘතියකින් ( Video Format එකකින් ) භාරදිය යුතුය

0. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ

නිර්මාණ භාර ගන්නා අවසාන දිනය - 2023 සැප්තැම්බර් 15

- විනිශ්චය මණ්ඩලය සඳහා සභාපති කෙනෙකුගෙන් යුතු හතර දෙනෙකුගේ කණ්ඩායම් තරග අංශ තුනම සඳහා පත්කරනු ලබයි